ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව
නීතිවේදී උපාධි පාඨමාලාව - 3 වන මට්ටම
අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය I - 2014/2015
නීති ක්‍රම - LWU1412
කාලය - පැය එකයි.

---

දිනය - 2015 සැප්තැම්බර් 09 වන දින වේලාව - මධ්‍යාහ්න 12.00 - ප.ව.01.00 දක්වා

---

**එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සපයන්න.**

**අපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩුකරනු ලැබේ.**

01. " මාගේ දැක්ම අනුව, විකාර රූපී ප්‍රතිඵල හටගන්නා ලෙස දැඩි වචනාර්ථයට යොමු නොවිය යුතුය. නීතිය, මාගේ දැක්ම අනුව, අර්ථ නිරූපණය කළ යුත්තේ අයිතීන් බලාත්මක කිරීම සඳහා ඉඩ ලබා දෙමින් අනර්ථය යටපත් වන ආකාරයෙනි."

Sriyani Silva v Iddamalgoda, Officer-In-Charge, Police Station,Payagala and Others (2003) 1 Sri LR 14, at p.21,Per Bandaranayake,J.

ඔබ ඉහත ප්‍රකාශය සමඟ එකඟ වන්නේ ද? ව්‍යවස්ථා අර්ථ නිරූපණ රීති ආශ්‍රයෙන් සාකච්ඡා කරන්න. අදාල අධිකාරයන් ඇසුරෙන් ඔබගේ පිළිතුර තහවුරු කරන්න. (ලකුණු 20)

02. 'පොදු නීති සම්ප්‍රදායේ අරටුව ලෙස අධිකරණ පූර්ව නිදර්ශන න්‍යාය පිහිටා තිබේ. සමාන කරුණු ඇති සෑම නඩුවක්ම එක සමාන ලෙස සලකා කටයුතු කිරීම එහිදී අවශ්‍ය වේ. කෙසේ නමුත්, මෙම න්‍යාය සම්බන්ධව විවේචකයන්ගේ තර්කය වන්නේ එමඟින් නීතියේ වර්ධනය අයුතු ලෙස සීමා විය හැකි බවයි. මෙම න්‍යායෙහි දැඩි ලෙස එල්බ සිටීම අයුක්තියට මඟ පෑදීමක් විය හැකි බවට ඔවුහු අනතුරු හඟවති.'

ඉහත ප්‍රකාශය ඇසුරින් පහත සඳහන් කාරණා උචිත උදාහරණ සහ විනිශ්චිත නඩු තීරණ අදාල කර ගනිමින් සාකච්ඡා කරන්න.

අ) තීරණයේ හරය සහ ආගන්තුක ප්‍රකාශ යන සංකල්ප අතර වෙනස; (ලකුණු 04)

ආ) මූලික, අනුගම්‍ය සහ අනුනයන පූර්ව නිදර්ශන; (ලකුණු 06)

ඇ) අනුගම්‍ය පූර්ව නිදර්ශන න්‍යාය මඟ හැරීමට සහ සීමා කිරීම සඳහා නීතිඥයින් සහ අධිකරණය විසින් භාවිතා කරන තාක්ෂණික උපක්‍රම/මෙවලම් මොනවා ද? (ලකුණු 04)

ඈ) අධිකරණ පූර්ව නිදර්ශන න්‍යාය මඟින් ක්‍රියාකාරී විනිසුරුවරයෙකුගේ නිර්මාණශීලී කාර්යභාරය සැලකිය යුතු අන්දමින් සීමා කරන්නේ යැයි ඔබ සිතන්නේ ද? (ලකුණු 06)

හිමිකම් ඇවිරිණි.

**THE OPEN UNIVERSITY OF SRI LANKA**
**FACULTY OF HUMANITIES AND SOCIAL SCIENCES**
**DEPARTMENT OF LEGAL STUDIES**
**LL.B DEGREE PROGRAMME – LEVEL III**
**CONTINUOUS ASSESSMENT TEST I– 2014/2015**
**LWU1412 – LEGAL METHOD**
**DURATION: 01 HOUR.**

**DATE: 09th September 2015** **TIME: 12.00 noon – 01.00 p.m.**

**Answer one (01) question only**

**Candidates will be penalized for illegible handwriting.**

01. "In my view a strict literal construction should not be resorted to where it produces such an absurd result. Law, in my view, should be interpreted to give effect to the right and to suppress the mischief".

*Sriyani Silva v Iddamalgoda, Officer-In-Charge, Police Station, Payagala and others (2003)1* Sri LR 14, at p. 21, *Per* Bandaranayake, J.

Do you agree with the above statement? Discuss with reference to rules of statutory interpretation. Support your answer with authorities. (20 marks)

02. 'The doctrine of judicial precedent lies certainly at the heart of the common law legal tradition. It requires all cases which have similar facts be treated alike. However, critics of the doctrine argue that it can unduly restrict the development of law and warn that the strict adherence to it would lead to injustice'.

In light of the above statement, discuss the following with reference to examples and decided cases:

a) The difference between the concept of ratio *decidendi* and obiter dicta; (04 marks)

b) The original, binding and persuasive precedent; (06 marks)

c) What are the techniques/tools used by courts and lawyers to avoid and limit the application of binding precedent? (04 marks)

d) Do you think that 'judicial precedent' significantly impedes the creative role of an activist judge? (06 marks)

*-Copyrights reserved –*